2020.02.25 මව්බිම පිටුව 4

# උද්ධමනය ඉහළ නගී

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශිත ජාතික පාරිභෝගික මිල දර්ශකයේ අලුත්ම දත්ත වාර්තාව අනුව පසුගිය දෙසැම්බර් මාසයේ 6.2 ලෙස වාර්තා වූ මතුපිට උද්දමනය මේ වසරේ ජනවාරි මාසයේදී 7.6ක් දක්වා වැඩි වී තිබේ.

2019 ජනවාරි මාසයට සාපේක්ෂව 2020 ජනවාරි මාසයේ ආහාර බාණ්ඩයේ ප්‍රතිශතය වැඩිවීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ එළවළු, සහල්, රතු ළූනු, කිරිපිටි සහ ලොකු ළූනුවල ඉහළ මිල මට්ටමක වාර්තා වීමය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ලක්ෂ්‍යයමය වෙනස්වීම් පදනම් නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති හා ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිබිඹු වන යටිදාර් උද්දමනය 2019 දෙසැම්බර් මස 5.2% සිට 2020 ජනවාරි මාසයේ 3.9% දක්වා අඩුවීමක් වාර්තා වේ.